**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2025.01.15 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. වෛද්‍ය නිලධාරි**

**අවශ්‍ය සුදුසුකම්:** **(i).** වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස අවම වශයෙන් වසර 3ක පළපුරුද්ද සහිත පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍ය උපාධිය

**වැටුප් පරිමාණය:** [U- MO 1(II) – 2016 A]
රු. 55,350 – 10 x 1,335 ; 1 x 1,630 – 70,330 (මාසික)

**සටහන:** 1. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සීමාවාසික වෛද්‍ය නිලධාරි ලෙස සේවා කාලය වෛද්‍ය වෘත්තිකයකු ලෙස පළපුරුද්ද ගණනය කිරීම සඳහා සලකා බලනු ලැබේ.

**2.** රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සේවයෙන් විශ්‍රාම ගොස් හෝ තාවකාලිකව නිදහස් වූ නිලධාරීන් සඳහා වැඩ පැවරුම් පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත සුදුසු දීමනාවක් සහිතව පත් කිරීම සලකා බලනු ලැබේ.

**සප්ත වාර්ෂික නිවාඩු :** වෛද්‍ය නිලධාරියෙකු පත් වීමෙන් පසු සෑම වසර හතකට වරක් වැටුප් සහිත වසරක සප්ත වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ඇති අතර අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛවල විධිවිධාන අනුව විදේශගත වන විට එම නිලධාරියාට සහ ඔහුගේ/ඇයගේ කාලත්‍රයාට ගුවන් ගමන් ප්‍රවේශ පත් විශ්වවිද්‍යාලය විසින් සපයනු ලැබේ.

**02. හෙද නිලධාරි II ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්:** **(i).** අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය.

**(ii).** ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනුමත හෙද ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

**වයස:** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** UMT 1(IIIA)
රු. 31,625 – 7 x 300 – 10 x 355 – 37,275/= (මාසික)

**03. මහජන සෞඛ්‍ය පරීක්ෂක III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්:** සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත්වීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** UMT 1(IIIA)
රු. 31,625 – 7 x 300 – 10 x 355 – 37,275/= (මාසික)

ඉහත මූලික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන අනෙකුත් දීමනා ද අදාළ රෙගුලාසිවලට අනුව ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.17,800.00
ii. 2022 වර්ෂයේ දීමනාව - රු. 5,000.00
iii. MCA දීමනාව - මූලික වැටුපෙන් 45%
iv. අතිරේක දීමනාව - මූලික වැටුපෙන් 20%

**විශේෂ සටහන :** හෙද නිලධාරි සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු සඳහා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරින් වැඩ පැවරුම පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා සලකා බැලිය හැකිය.

මීට අමතරව වෛද්‍ය නිලධාරි තනතුරට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1000 විධිවිධාන අනුව මූලික වැටුපෙන් 35% ක පර්යේෂණ සහ සංවර්ධන දීමනාවක් ද හිමි වේ.

**සේවා කොන්දේසි**

1. මෙම තනතුරු ස්ථිරය, පත්වීම් වසර තුනක (03) ක පරිවාස කාලයකට යටත් වේ.

2. තෝරාගත් අපේක්ෂකයින් දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරන්නේ නම් ඔහුගේ / ඇයගේ නිදහස් කිරීම ලබා ගත යුත්තේ අදාළ පත්කිරීමේ අධිකාරිය හරහා ය. රජයේ සේවකයින්ට විශ්වවිද්‍යාල සේවයේ සිටියදී විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවත්වා ගැනීමට අයිතියක් නැත.

3. විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප් අයිතිය පවත්වා ගැනීමට අයිතියක් නැත.

**ප්‍රතිලාභ**

තෝරාගත් අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර විශ්වවිද්‍යාලය මඟින් එකී ඉපයීම් වලින් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලීය විශ්‍රාම වැටුපටද 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත. එයට අමතරව 3% ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් සේවක භාරකාර අරමුදලට ද බැර කරනු ඇත.

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

අයදුම්පත් www.sab.ac.lk /Vacancies විශ්විද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

විශ්වවිද්‍යාල සේවයේ /රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ උපාධි/ අධ්‍යාපන සහතිකපත්, වෘත්තීය සහතිකපත් සහ අනෙකුත් සහතිකපත්වල ඡායා පිටපත් සමග **2025.01.15** දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයන්ට යොමු කළ යුතු අතර අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතු ය.

.

**වෛද්‍ය නිලධාරි :** **නියෝජ්‍ය ලේඛකාධිකාරි, අධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය තැ.පෙ. 02, බෙලිහුල්ඔය**

**හෙද නිලධාරි II ශ්‍රේණිය /**
**මහජන සෞඛ්‍ය පරීක්ෂක II ශ්‍රේණිය: සහකාර ලේඛකාධිකාරි, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය තැ.පෙ. 02, බෙලිහුල්ඔය**

අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විමසීම් academicest@adm.sab.ac.lk යන විද්‍යුත් තැපැලට හෝ 045 2280215 / 045 2280047 යොමු කළ හැකිය.

අවශ්‍ය විස්තර සඳහන් කර නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත්/ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්/ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
2024.12.27